# ආශ්චර්යා ජයකොඩි ගේ සම්පූර්ණ කතාව

"සියලු දෙනාටම ආයුබෝවන්! ගරු විමල් වීරවංශ මැතිතුමනි, ගරු ආචාර්යතුමනි, මට අවසරයි. බොහොමත්ම ස්තුතියි. අද අපි පොදු කාරණාවක් වෙනුවෙන් හඬ නගන්නට එකතු වී සිටිනවා. මේ සඳහා මට ආරාධනා කිරීම සම්බන්ධයෙන් මම විමල් වීරවංශ මැතිතුමාට මගේ කෘතවේදීත්වය ප්‍රකාශ කරනවා. මම මාධ්‍ය සාකච්ඡාවකට සහභාගි වන්නේ සෑහෙන කාලයකට පසුවයි. ඒ නිසා මුලින්ම මා කවුද යන්න සහ මා අද මෙතැනට පැමිණි කාරණාව පිළිබඳව කෙටි විග්‍රහයක් කළ යුතුයි. මොකද, හැම දේකම වැරදි අඩුපාඩු දකින, අපි කියන විදියේ අන්තවාදී ඇත්තන් මේ රටේ ඉන්නකොට, අපි මෙතැනට ආපු පරමාර්ථය පවා විකෘති කරන්න ඔවුන් උත්සාහ කරන්න පුළුවන්.

මෙහි කිසිදු දේශපාලන අරමුණක් නැහැ. මා වගේම විමල් ඇමැතිතුමාත්, අර ආචාර්යතුමාත්, ඒ වගේම මේ මතය දරන, කොන්දක් ඇති තවත් බොහෝ නායකයන් සහ මිනිසුන් මේ රටේ ජීවත් වන බව මම දන්නවා. මා අද මෙතැනට පැමිණීමට ප්‍රධානතම හේතුව තමයි, මීට දින කිහිපයකට පෙර මෙරට තුළ මෙන්ම ජාත්‍යන්තරයේ ද 'මුල්ලිවෛක්කාල් සැමරුම' නැතහොත් 'ද්‍රවිඩ සමූල ඝාතන දිනය' (Genocide Day) ලෙස සමරනු ලැබීමයි. සමහර ස්ථානවල මෙය රාජ්‍ය අනුග්‍රහය යටතේ පැවැත්වීම ගැන මම දැඩි සේ කනගාටු වෙනවා. මෙහිදී රාජ්‍ය අනුග්‍රහය කියන්නේ මැති ඇමැතිවරුන් සහභාගි වීම පමණක් නෙමෙයි; ඒ සඳහා පොලිස් ආරක්ෂාව ලැබීමත් රාජ්‍ය අනුග්‍රහයක්ම තමයි.

මම කවුද කියා විනාඩි කිහිපයකින් පැහැදිලි කරන්නම්. මම සාමාන්‍ය පවුලක ඉපදුණු, බොහෝ සිහින තිබුණු, පවුලේ එකම සහ ලොකු දියණියයි. කාන්තාවක් විදිහට ජීවිතයේ බලාපොරොත්තු රැසක් මට තිබුණා. නමුත් වසර ගණනාවකට පෙර, එක්තරා මාතර් 10 වැනිදාවක මගේ ඒ සියලු සිහින සුන්බුන් වී ගියා. එදා මම මගේ රැකියාව අවසන් කර වාහනයෙන් ගෙදර එන අතරතුර, එවකට සිටි අනුරුද්ධ රත්වත්තේ මහතා ඉලක්ක කරමින් කොටි ත්‍රස්තයන් අටවා තිබූ ක්ලේමෝ බෝම්බයකට මා ගොදුරු වුණා. එම ප්‍රහාරයෙන් 46 දෙනෙක් මියගිය අතර, මා ඇතුළු තවත් බොහෝ පිරිසක් අතිශය දරුණු ලෙස ආබාධිත තත්ත්වයට පත් වුණා. ක්ලේමෝ බෝම්බයක් හදන්නේ කුඩා යකඩ කෑලි දහස් ගණනක් එකතු කරලයි. එදා මගේ වාහනය සිදුරු 265කින් විනිවිද ගොස් තිබුණා. මගේ ශරීරය දෙස බැලුවොත්, අදටත් හිසේ සිට දෙපතුළ දක්වා ශරීරය ඇතුළේ යකඩ කෑලි දරාගෙන ජීවත් වන කාන්තාවක් මමයි.

අපේ දුක සහ පීඩාව හැමවෙලාවෙම මුහුණෙන්, වචනයෙන් හෝ ඉරියව්වලින් ප්‍රකාශ කරමින් රඟපාන්න මම සූදානම් නැහැ. මම හැමවෙලාවකම වගකීමෙන් ජීවත් වුණා. මගේ ශරීර පීඩාවන් හෝ මගේ ඇතුළාන්තයේ තියෙන ගැඹුරු වේදනාවන් සමාජයට පෙන්වන්න මා උත්සාහ කළේ නැහැ. නමුත් මෙවැනි අවස්ථාවක මම මේවා කිව යුතුමයි. මගේ හදවත අසලම තවමත් බෝම්බ කැබැල්ලක් (Shrapnel) ඉතිරි වෙලා තියෙනවා. මගේ මොළයේ මධ්‍යස්ථානයට (Brain Center) හානි වී ඇති නිසා, මට අදටත් කිසිදු MRI ස්කෑන් පරීක්ෂණයක් වැනි විද්‍යුත් චුම්භක ශක්තියක් සහිත වෛද්‍ය පරීක්ෂණයකට මුහුණ දෙන්න බැහැ. මගේ කකුල්වල හමට ඉතා ආසන්නයෙන් යකඩ බෝල තියෙනවා; කැමති කෙනෙකුට ඒවා අල්ලා බලා සත්‍යය තහවුරු කරගන්න පුළුවන්. මට දැන් ඇස් පෙනෙන්නේ නැහැ. මගේ දෘෂ්ටි විතානය (Retina), කෝනියාව (Cornea) සහ ඇස්වල ස්නායු පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වී තිබෙනවා. ඇස්පිළි වැසී තිබෙන්නේත්, මුහුණේ සමට හානි වී තිබෙන්නේත් ඒ දරුණු බෝම්බ ප්‍රහාරයේ ප්‍රතිඵලයක් නිසයි.

දිගු කලක් මට ඇවිදින්නට පවා නොහැකිව සිටියා. මගේ වම් පාදයේ අස්ථි සම්පූර්ණයෙන්ම කුඩුපට්ටම් වී තිබූ අතර, වෛද්‍යවරුන් මගේ කකුල කපා දැමීමටයි තීරණය කර තිබුණේ. නමුත් මා ඉතා තරුණ වයසේ පසු වූ නිසා, සුවපත් වීමට යම් හෝ සම්භාවිතාවක් තිබේ දැයි බැලීමට ඔවුන් ටික කාලයක් ඉඩ දුන්නා. දෙවියන්ට ස්තූතිවන්ත වන්නට, වසර එකහමාරකට පසු මට නැවත නැගිටීමට හැකි වුණා. නමුත් වසර 25ක් තිස්සේ මට ලෝකය පෙනෙන්නේ නැහැ. එදා මා ත්‍රස්ත ප්‍රහාරයකට හසු වන විට මම දැන සිටියා, කොටි ත්‍රස්තවාදියා ඉලක්ක කළේ මාව නෙවෙයි කියලා. ඔහුගේ අරමුණ වුණේ එවකට පැවති රජයට රිදවීම සඳහා සිවිල් වැසියන් ඝාතනය කිරීමයි. ඒ නිසයි මම කියන්නේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් කියන්නේ මෝඩ, තිරිසන් රැළක් කියා.

මට බෝම්බ වැදී මගේ ඇස් නොපෙනී ගියත්, එතෙක් මෙතෙක් බලයට පත් වූ කිසිදු ආණ්ඩුවක් මා ගැන හැඬුවේ නැහැ. මට ජීවත් වෙන්න සහය වෙන්න හෝ මගේ ජීවිතය යථා තත්ත්වයට පත් කරන්න කිසිම ආණ්ඩුවක, කිසිම බලධාරියෙක්, නිලධාරියෙක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් (NGO) ඉදිරිපත් වුණේ නැහැ. අද මම ඉන්න තැනට ආවේ මගේම උත්සාහයෙන් සහ වෘත්තීය දක්ෂතාවයෙන්. ඔබට අවශ්‍ය නම් අන්තර්ජාලය ඔස්සේ 'Acharya Jayakody Sri Lanka' කියා සොයා බලා, මම කවුද සහ මා සමාජයට කර ඇති සේවය කුමක්ද කියා දැනගත හැකියි. මේ තත්ත්වයට එන්න මට වසර 25ක් ගත වුණා. මම වින්ද අප්‍රමාණ දුක මගේ මුහුණෙන්, සමෙන් හෝ මගේ ඇඳුම් පැළඳුම්වලින් ප්‍රකාශ වන්නේ නැහැ. සැබෑ ලෙසම දුක් විඳින මිනිසුන් රඟපාන්නේ නැහැ.

අපි මේ රටේ සාමාන්‍ය විදිහට ජීවත් වූ මිනිසුන්. යුද්ධයකට සෘජුව හෝ වක්‍රව කිසිදු දායකත්වයක් නොදැක්වූ අසරණ සිවිල් වැසියන්ව ඉලක්ක කර ගනිමිනුයි එල්.ටී.ටී.ඊ. ප්‍රහාර දියත් වුණේ. එදා කොපමණ දහස් ගණනක් මියගියාද, ආබාධිත වුණාද කියා අද මිනිසුන්ට මතක නැහැ. අහිංසක කිරිසප්පයන්ව පොළොවේ සහ ගස්වල ගසා මරා දැමුවේ මේ ත්‍රස්තවාදීන්මයි. ගැබිනි අම්මලාගේ බඩ කපා දරුවාත් සමඟ මරා දැමුවේ මේ ත්‍රස්තවාදීන්මයි. මේවා මේ ලෝකයේ සාමය හෝ රටේ මිනිසුන්ගේ අනාගතය වෙනුවෙන් කරපු ඝාතනද? ඒවාට 'ජනසංහාර' (Genocide) කියන්නේ නැද්ද?

අද වැල්ලවත්තේ සහ යාපනයේ සමහරු බෝඩ් ලෑලි උස්සාගෙන ත්‍රස්තවාදීන් සමරනවා. මේ අයට යුද්ධයේ සේයාවක්වත් වැදිලා තියෙනවද කියා මම දන්නේ නැහැ. සමහර විදේශීය රටවල එල්.ටී.ටී.ඊ. ප්‍රභාකරන්ගේ මියගිය බාල පුතාගේ පිළිරූ පවා උස්සාගෙන සමරන බව මට දැනගන්න ලැබුණා. ඔව්, ඔහු දරුවෙක්; ඔහු මියගියා. නමුත් මේ රටේ මියගිය අනෙක් දරුවන් සහ සිවිල් වැසියන් ගැන කතා කරන්නේ කවුද? ත්‍රස්තවාදීන් විසින් මරා දැමූ සිංහල, දෙමළ, මුස්ලිම් අම්මලා තාත්තලා සහ දරුවන් වෙනුවෙන් අයිතිවාසිකම් කෝ? ලංකාව කියන්නේ බහුජාතික, බහුආගමික රටක් කියා මම කුඩා කාලයේ සිටම ඉගෙන ගත්තා. මෙහි දෙමළ, සිංහල, ඉංග්‍රීසි සහ මැලේ භාෂා කතා කරන ජාතීන් ජීවත් වෙනවා. දේශපාලනඥයන් සහ අන්තවාදීන් ගැටුම් ඇති කරන්නේ නැතිව, මේ සාමාන්‍ය ජනතාව අතර කවදාවත් ගැටුමක් තිබුණේ නැහැ.

දැන් යුද්ධය අවසන් වී තිබෙනවා. 2011 මාතර්ු 31 වැනිදා එවකට එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කී මූන්ගේ විශේෂඥ කමිටු වාතර්ාව මගින් එල්.ටී.ටී.ඊ. ත්‍රස්ත සංවිධානය සිදු කළ සමූල ඝාතන සහ විනාශයන් ගැන පැහැදිලිව ඉදිරිපත් කර තිබෙනවා. එහෙම වාතර්ාවක් තිබියදීත්, මේ උදවිය තැන් තැන්වල බෝඩ් උස්සාගෙන 'ජනසංහාර දිනයක්' ගැන කතා කරන්නේ ඔවුන්ගේ සිහින ලෝකයේ ඊළාම් රාජ්‍යයක් ගොඩනැගීමට නොහැකි වූ නිසයි. ලෝකයේ වැඩිම දෙමළ ජනතාවක් ඉන්නේ තමිල්නාඩුවේ; ඔවුන්ට අවශ්‍ය නම් ඊළාමයක් එහේ හදාගත හැකියි. යාපනය කියන්නේ කොච්චර කුඩා ප්‍රදේශයක්ද? ලංකාව කොච්චර කුඩා රටක්ද? භූමිය අතින් බැලුවොත් අපිට වඩා විශාල ඉන්දියාවේ නායකයන් බොහොම ඥානවන්තයි. ඔවුන් මේ අන්තවාදීන්ට ඉන්දියාව ඇතුළේ සෙල්ලම් කරන්න ඉඩ දුන්නේ නැහැ. ඔවුන් ඒ ඊළාම් සංකල්පය ලංකාවට, යාපනයට තල්ලු කරලා අහිංසක දමිළ දරුවන්ව විනාශ කළා.

මට තේරෙන්නේ නැති එක දෙයක් තියෙනවා. තව ටික කලක් යනකොට කවුරු හරි බෝඩ් උස්සගෙන කියයිද 'ශ්‍රී ලංකාව කියන්නේ ඉන්දියාවේ කොටසක්, ලංකාවේ ඉන්න සිංහල ත්‍රස්තවාදීන්ගෙන් අපේ ඉන්දියානු කොටස බේරාගන්න' කියා. වතර්මාන පාලකයන් මේ තරම් නිවට පාලනයක් ගෙන යයි කියා මම හීනෙකින්වත් හිතුවේ නැහැ. මට අද ලැජ්ජයි. මාව පුදුමයට පත් කළ තවත් කාරණාවක් තිබෙනවා. එක්තරා දේශපාලන මහත්මයෙක් තමන්ගේ යටඇඳුම්වල පවා හිල් තිබෙන බව බොහොම ආඩම්බරයෙන් කිව්වා. නමුත් ටික කලක් යනකොට එතුමාගේ තෙමහල් සුඛෝපභෝගී මන්දිරයක් පිළිබඳව තොරතුරු හෙළි වුණා. මහත්මයෝ, ඔබ නිවාස තුනක් නෙමෙයි පහක් හැදුවත් අපිට ප්‍රශ්නයක් නැහැ; අපි ඊෂ්‍යාර් කරන්නේ නැහැ. මිනිසුන් දියුණු විය යුතුයි, ලස්සනට ජීවත් විය යුතුයි. අවුරුදු සියයකටත් වඩා අඩු කාලයක් ජීවත් වන මිනිසාට හොඳින් කාලා බීලා, හොඳ නිවසක් ඇතුව, ලස්සනට ඇඳ පැළඳ ජීවත් වීමේ අයිතියක් තිබෙනවා. එතුමාටත් ඒ අයිතිය තිබිය යුතුයි. හැබැයි යටඇඳුම්වල හිල් කියා ප්‍රසිද්ධියේ කියමින් මෙවැනි සුඛෝපභෝගී මන්දිර හදනකොට, තමන්ගේ පවුලේ අයටවත් මුලින්ම හොඳ ඇඳුමක් අරන් දෙන්න ඕනෑ කියා එතුමාට හිතුණේ නැද්ද? එතුමාට තියෙන වත්කම් අනුව, ඔහුට සාමාන්‍ය ඇඳුම් නෙවෙයි, Calvin Klein, Tommy Hilfiger වැනි ලෝක ප්‍රකට සන්නාමයන්ගේ ඇඳුම් අඳින්න පුළුවන්. මම ලෝක සම්මානිත මෝස්තර නිමර්ාණ ශිල්පිනියක් (Fashion Designer) විදිහට, අවශ්‍ය නම් ඔබතුමා වෙනුවෙන් ඇඳුම් නිමර්ාණය කර දෙන්නම්.

නමුත් මට ඔය ඇඳුම්වල තියෙන හිල් ගැන ප්‍රශ්නයක් නැහැ. මම අහන්නේ, ඔබලාගේ මොළ ඇතුළේ හිල් තිබෙනවාද? ආත්මය ඇතුළේ හිල් තිබෙනවාද? බලනකොට මේ අයගේ තීරණ ගැනීම් තුළ හිල් තිබෙනවා. ඔවුන් මේ රට දෙස බලන ආකල්ප සහ ඔවුන්ගේ දේශපාලන මතිමතාන්තර තුළ හිල් තිබෙනවා. මුළු සවර්ාංගයම හිල් වෙලා තියෙන්නේ මේ අයගේයි. මට ලැජ්ජයි. වසර ගණනාවකට පසු මා මේ මාධ්‍ය සාකච්ඡාවට පැමිණීමට තීරණය කළේ, වතර්මානයේ කොටි ඩයස්පෝරාව විවිධ නාමයන්ගෙන් පෙනී සිටිමින්, මුදල් එකතු කරමින්, විවිධ අරමුණු සඳහා තරුණයන් බඳවා ගන්නා නිසයි. ඔවුන් සතුව ඩොලර් මිලියන ගණනක අරමුදල් තිබෙනවා. අද කාලේ රුපියල් පහළොස්දහසකට මිනිසෙකුගේ අතපය කපන තත්ත්වයට රට පත්ව තිබෙනවා නම්, බැංකු ගිණුමකට හොර රහසේ රුපියල් විසිපන්දහසක් හෝ පනස්දහසක් වැටෙනකොට අපේ රටේ සමහර මිනිසුන් බෝඩ් ලැල්ලක් උස්සාගෙන පාරට නොබසීවිද? එහෙම මුදලට පාවා දෙන අයත් මේ රටේ ඉන්නවා.

පසුගියදා මුල්ලිවෙක්කාල් සැමරුමට එරෙහි වූ විමල් වීරවංශ මැතිතුමාට පොලිසිය බාධා කළ පුවත අසා මම පුදුමයට පත් වුණා. මොන නීති සංග්‍රහයක් යටතේද එතුමාට එසේ කළේ? ඇත්තටම එතැන එතුමා සමඟ මමත් සිටිය යුතුව තිබුණා. මොකද, එදා තමන්ගේ ජීවිතය ගැන පවා නොසිතා රට වෙනුවෙන් කැප වූ අභිංසක රණවිරුවන් නිසයි අද මම ඇස් නොපෙනුණත් මේ විදිහට හුස්ම ගන්නේ. මීට වසර කිහිපයකට පෙර මට යුද හමුදාවේ රාජකාරියක් අතරතුර 'පොඩි මැණිකා' නම් මවක් හමුවුණා. ඇය යුද්ධයෙන් මියගිය රණවිරුවන්ගේ මැණිවරුන් කිහිපදෙනෙකු සමඟ පැමිණ සිටියා. ඇය ඉතා මිටි මවක්; ඇය මගේ ඉණ වටා බදාගෙන හඬන්නට වුණා. ඇගේ මුළු සවර්ාංගයම වෙව්ලන්නට වුණා. ඇයට පුතුන් තිදෙනෙකු සිටි අතර, ඒ තිදෙනාම යුද්ධයට ගොස් මියගොස් තිබුණා. "අනේ නෝනා, අද මට එකම දරුවෙක්වත් නැහැ" කියා ඇය වැලපුණා. අද පාලන තන්ත්‍රයේ ඉන්න ඇත්තන්ගේ කවුරුත් යුද්ධයට බිලි වුණේ නැහැ, අතක් පයක් කැඩුනේ නැහැ, රිදුණේ නැහැ. ඒ වේදනාව දැනෙන්න නම් තමන්ටම රිදෙන්න ඕනෑද? මනුෂ්‍යයෙකු විදිහට හිතන්න ඔබලාගේ මනස අබ්බගාතද? ආත්මයෙන්ම ඔබලා පැරලයිස් (පක්ෂඝාත) වෙලාද? මනුෂ්‍යයන් විදිහට හැඟීම් දැනීම් නැද්ද?

මම අහන්නේ මේ ලංකාවේ පොලිසි දෙකක් තියෙනවද? එකක් පුද්ගලික පොලිසියක්, අනෙක රාජ්‍ය පොලිසියක්ද? ඇයි මේ විදිහට නීති දෙකක් ක්‍රියාත්මක වෙන්නේ? වැල්ලවත්තේ පොලිස් ආරක්ෂාව යටතේ කොටි ත්‍රස්තයන් සමරන්න ඉඩ දෙනවා නම්, ඊට එරෙහි වන විමල් වීරවංශ ඇමැතිතුමාට පොලිසිය බලපෑම් කරන්නේ කොහොමද? ඒ පොලිසියේ සිටින සාමාන්‍ය නිලධාරීන් කෙරෙහි මගේ පුද්ගලික තරහක් නැහැ. පව්, ඒ මහත්වරු උසස් නිලධාරීන්ගේ සහ පාලකයන්ගේ වුවමනාවට රූකඩ වගේ නටනවා ඇති. හැබැයි ඒ මහත්වරුන්ගේ බිරින්දෑවරුන් නිවෙස්වල ඉන්නවානේ; කරුණා කරලා ඒ නෝනලා තමන්ගේ සැමියන්ට කියන්න, මෙවැනි නපුංසක වැඩවලට හවුල් වෙන්න එපා කියා. මේ පොලිස් ක්‍රියාකලාපය ගැන ලැජ්ජයි. කාන්තාවක විදිහට, ඇස් නොපෙනෙන කෙනෙකු විදිහට මට තියෙන කොන්ද පණ ඇති කෙළින් කෙරෙන ගතිගුණවත් ඔබලාට නැහැ.

මීට වසර 30කට පෙර අපි නිවසින් එළියට බැස්සේ නැවත නිවසට ඒමට හැකි වෙයිද යන බියෙන්. මේ රටේ හැම මනුෂ්‍යයෙක්ම ඒ බිය වින්දා. අද වතර්මාන ශ්‍රී ලංකා යුද හමුදාවේ සිටින බහුතරයකට ඒ දරුණු යුද අත්දැකීම් නැහැ. වතර්මාන ජනාධිපතිතුමා කියනවා නැවත යුද්ධයක් ඇති වෙන්නේ නැහැ කියා. නමුත් අද ලෝකය පෙර තිබූ තත්ත්වයට වඩා වෙනස්. රටක් වට්ටන්න අද කාලතුවක්කු, මිසයිල හෝ අන්තර් මහද්වීපික බෝම්බ (ICBM) අවශ්‍ය නැහැ. රටක් විනාශ කරන්න ඕනෑ තරම් ක්‍රම තිබෙනවා. ඒ හැම විදිහක්ම අද ත්‍රස්තවාදීන් සහ ඇතැම් ජාත්‍යන්තර බලවේග මේ රට තුළ ක්‍රියාත්මක කරමින් සිටිනවා.

මම අද වගකීමෙන් කියනවා, ලබන වසරේත් මේ දිනය මෙලෙස සමරන්නට රටේ බලධාරීන් ඉඩ දුන්නොත්, මා ඇතුළු මේ රටට ආදරය කරන, හැඟීමක් ඇති විශාල පිරිසක් එකතු වී ඊට එරෙහි වනවා. අපි මුලින්ම කරන්නේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරන ලද ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා, අමිතර්ලිංගම්, නීලන් තිරුචෙල්වම් සහ ලක්ෂ්මන් කදිරගාමර් වැනි දෙමළ නායකයන්ගේ පිළිරූ ඉදිරිපත් කර, ඒවට මල් තබා උපහාර දැක්වීමයි. මොකද, කොටි ත්‍රස්තවාදීන් මුලින්ම ඝාතනය කළේ ඔවුන්ගේම මතවාදයට අභියෝගයක් වූ තමන්ගේම ද්‍රවිඩ නායකයන්වයි. ඒ බව අමතක වුණාද? යුද්ධය ඉවරයි; තවත් කුමකටද බිල්ලක් දෙන්න හදන්නේ?

ඊළඟට, මම කැමතියි විශේෂයෙන්ම ජීවන්ත පීරිස් පියතුමාට උත්තර දෙන්න. මම හිතන්නේ ඔබතුමාට උත්තර දෙන්න සුදුසුම කෙනා මමයි. කරුණාකර කරලා එතුමා ප්‍රකාශ කළ ඒ වීඩියෝව වාදනය කරන්න, එවිට මම කුමන කාරණයටද පිළිතුරු දෙන්නේ කියා පැහැදිලි වෙයි.

(ජීවන්ත පීරිස් පියතුමාගේ ප්‍රකාශය සහිත වීඩියෝ පටය වාදනය වේ):

"කවුරුන් විසින් ලියන ලද ඉතිහාසයක්ද අපි තාමත් කියවන්නේ? අපි දන්නේ ප්‍රභූ ද්‍රවිඩ ජාතිකවාදී න්‍යාය පත්‍රයේ ඉතිහාසයයි. මේ වගර් සංහාරය පිළිබඳ වාතර්‍ා කියවද්දී අපට හමුවෙනවා ෆ්‍රැන්සිස් ජෝසප් පියතුමාගේ චරිතය. 2009 මැයි 10 වැනිදා එතුමා වතිකානුවේ ශුද්ධෝත්තම පාප්වහන්සේට ලිපියක් ලියනවා. එහිදී එතුමා කියනවා ත්‍රස්තවාදය තුරන් කිරීමේ මුවාවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව යුද්ධ කරන්නේ දෙමළ ජාතිය මුලින්ම උදුරා දැමීමටයි, මෙය වගර් සංහාරක යුද්ධයක් කියා. එතුමා ඉතාමත් පැහැදිලිව වචනගත කරනවා, පොකුරු බෝම්බ (Cluster Bombs) ඇතුළු ප්‍රචණ්ඩත්වය මනුෂ්‍යාත්වයට එරෙහි අපරාධයක් කියා. අන්න එතැනදී තමයි 2009 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ මුල්ලිවෙක්කාල් ප්‍රදේශයේ 46,000කට අධික පිරිසක් අතුරුදන් වී ඇති බව වාතර්‍ා වෙන්නේ. සමස්ත යුද සමයේ 146,000ක ජනගහනයක් අතුරුදන් වී තිබෙනවා. ලංකාවේ පැවතුණේ හුදෙක් ජනසංහාරයක් නෙමෙයි, ද්‍රවිඩ වගර්යා සම්පූණර්යෙන්ම වඳ කර දැමීමේ වගර් සංහාරයක්. එතැන් සිට හැම ආණ්ඩුවක්ම ද්‍රවිඩ ජනතාව පීඩාවට පත් කරමින් 56, 58 කෝලාහල, 64 ශ්‍රී-ශාස්ත්‍රී ගිවිසුම, 83 කළු ජූලිය ඇති කළා..."

දැන් මම මේකට උත්තර දෙනවා. ජීවන්ත පීරිස්, මම ඔබට කියන්නේ මුලින්ම ඔය 'ජීවන්ත' කියන නම අයින් කරලා 'ජූදාස් පීරිස්' (Judas) කියා නම දාගන්න කියායි. මොකද, ජූදාස් යේසුස් වහන්සේව පාවා දුන්නේ රිදී කාසි 30කටයි. මම ඔබතුමාගෙන් අහන්නේ, මේ පාවාදීමට ඔබට කොපමණ මුදලක් ලැබුණාද? ඒවා රිදී කාසි වෙන්න බැහැ, ඩොලර් හෝ වෙනත් විදේශ විනිමයක් වෙන්න ඇති. ඔබට ලැජ්ජයි (Shame on you!). ඔබතුමා පියතුමෙක්ද? ඕනෑම වේදිකාවක මා සමඟ විවාදයකට එන්න කියා මම අභියෝග කරනවා. ඔබ බයිබලය දන්නේ නැත්නම් මම ඔබට බයිබලය කියා දෙන්නම්. බයිබලයේ එක තැනක සඳහන් වෙනවා, 'අවසාන කාලයේදී යක්ෂයා දෙවියන්ගේ සිංහාසනයේ වාඩි වී තමන් දෙවියන් බව පවසනු ඇත' කියා. තවත් තැනක තියෙනවා, 'පරිස්සම් වන්න, යක්ෂයා සැමවිටම පැමිණෙන්නේ ආලෝකයේ දූතයෙකු ලෙස වෙස්වලාගෙනයි' කියා. පියතුමනි, ඔබ කෙරෙහි කිසිදු ගරුත්වයක් මට නැහැ. මමත් කතෝලිකයෙක්. මේ වගේ විකෘති වූ මොළයකින් අසත්‍ය තොරතුරු මාධ්‍යගත කරලා ඔබ බලාපොරොත්තු වෙන්නේ කුමක්ද? ඕනෑම අවස්ථාවක මම ඔබට අභියෝග කරනවා.

මම මේ අහගෙන ඉන්න හැමෝටම කියනවා, 'The Pope's Exorcist' කියා චිත්‍රපටයක් තිබෙනවා, එය නරඹන්න කියා. එය වතිකානුවේ පාප්වහන්සේගේ ප්‍රධාන යක්ෂයා දුරු කරන්නා වූ ගේබ්‍රියල් අමෝතර් පියතුමාගේ සත්‍ය කතාවක් ඇසුරින් නිමර්‍ාණය වූවක්. ඔහු 1986 සිට 2016 දක්වා පාප්වහන්සේලා තිදෙනෙකු යටතේ සේවය කළා. එම චිත්‍රපටයේ පල්ලිය ඇතුළෙම සිටින, නමුත් පල්ලියේ යහපත් කටයුතුවලට බාධා කරන එක්තරා බිෂොප්වරයෙකුගේ (ආගමික නායකයෙකුගේ) චරිතයක් තිබෙනවා. පියතුමනි, ඔබව දකිනකොට මට මතක් වෙන්නේ ඔහුවයි. අවසානයේදී ඒ බිෂොප්වරයා යක්ෂ බලවේගයන්ට හසු වී විනාශ වෙනවා.

ඒ වගේම අද ඇතැම් ආගමික ස්ථාන හා යාච්ඤා මධ්‍යස්ථාන පවත්වාගෙන යන අය ඉන්නවා. බයිබලයේ ලූක් අධ්‍යයනය, 10 වැනි පරිච්ඡේදයේ පැහැදිලිව කියනවා, අප දෙවියන් වහන්සේගේ අනුගාමිකයන් ලෙස උන්වහන්සේගේ සුභාරංචිය දේශනා කරන්න යනවා නම්, කරුණු තුනක් අත්හැරිය යුතුයි කියා. ඒ තමයි මුදල් පසුම්බිය, මල්ල සහ පාවහන් යුවළ. මෙහි අර්ථය තමයි, සැබෑ පූජකයෙකු මුදල් හා ධනය අත්හැරිය යුතුයි, තමන්ගේ ජීවිතය සුඛෝපභෝගී කරන දේවල් (මල්ල) අත්හැරිය යුතුයි, පොළොවේ ගල්කැටයකින් දැනෙන වේදනාව පවා විඳ දරාගනිමින් පාවහන් නොමැතිව වුවද කැපවිය යුතුයි කියා. දෙවියන්ගේ සේවයට කැපවන පූජකයා දුක, පීඩාව සහ හිඟකම විඳින්න පුරුදු විය යුතුයි. නමුත් අද සමහර තැන්වල ඉටිපන්දමක් රුපියල් 5000ට විකුණනවා. තව ටික දවසකින් ඔවුන් කියයි ස්වගර්යට යන පාර පෙන්වන්න ලක්ෂ පහක් දෙන්න කියා. ඒවට රැවටෙන මිනිස්සුත් මේ රටේ ඉන්නවා. මම ඉතාමත් ආදරයෙන් කියන්නේ, කරුණා කරලා සිහිය එළවාගන්න. දෙවියන් සහ මුදල් කවදාවත් එකට ගමන් කරන්නේ නැහැ. එක්තරා පූජකයෙක් කියනවා ශුද්ධාත්මයන් වහන්සේ මුදල්වලට බොහෝම ආදරෙයි කියා. දේව ධමර්ය තුළ මිනීමැරුවත් සමාව දෙනවා, නමුත් සමාව නොදෙන එකම වරද තමයි ශුද්ධාත්මයන් වහන්සේට පරිභව කිරීම. ඒ නිසා ඔවුන්ට කුමන දඬුවම් ලැබෙයිද කියා මම දන්නේ නැහැ.

සැබෑ වැරැද්ද කරන්නේ කවුද? යමෙකුට මුහුදට පැනීමට අවශ්‍ය නම් එය ඔහුගේ පුද්ගලික කැමැත්ත (Free Will). නමුත් අහිංසක මිනිසුන් මුළා කර, මුහුදට පැන්නොත් ස්වගර්යට යා හැකියි කියා ඔවුන්ව පොළඹවනවා නම් එය මහා අපරාධයක්. වැරැද්ද කරන මිනිසුන්ට වඩා වැරැද්දට අනුබල දෙන, වැරැද්දට පරිසරය සකසන, ඍජුව හෝ වක්‍රව උල්පන්දම් දෙන පිරිස ඊට වඩා ලොකු වරදක් කරන්නේ. වතර්මාන රජය කරමින් සිටින්නේත් එයයි. අද දසසිල්වත් දන්නේ නැති, කරණීයමෙත්ත සූත්‍රයවත් කටපාඩමින් කියන්න බැරි අය බුද්ධාගම ගැන කතා කරනවා. සොරුන්ට, වංචනිකයන්ට සහ යක්ෂයන්ට සැඟවී සිටීමට ඇති හොඳම තෝතැන්න අද මේ පැවිදිකම සහ පූජකකම වී තිබෙනවා. නොමිලේ ලැබුණු දහම විකුණාගෙන කන මෙවැනි තිරිසනුන්ගෙන් බේරී, කරුණා කරලා සිහිය එළවාගන්න කියා මම ජනතාවගෙන් ඉල්ලනවා. ඉටිපන්දම් විකුණා දිනකට උපයන ලක්ෂ ගණනක මුදල් පාවිච්චි කරන්නේ මේ රටේ දේශපාලනය වෙනස් කරන්නයි. ජීවන්ත පීරිස්, මට ඔබට තවත් කියන්න දෙයක් නැහැ. මම ඔබ ගැන ලැජ්ජ වෙනවා.

ලබන වසරේත් මේ විදිහට කොටි ත්‍රස්තයන් සැමරීමට රජය ඉඩ දුන්නොත්, ඊට එරෙහිව හෘද සාක්ෂියක් ඇති බුද්ධිමත් ජනතාව දහස් ගණනින් පාරට බසිනවා ඒකාන්තයි. මේ රට අප හැමෝගෙමයි, මෙහි බෙදා වෙන් කරන්න කොටස් නැහැ. මගේ ජීවිතයේ මට සිදුවූ ලොකුම අපරාධය ත්‍රස්තවාදීන්ගෙන් වගේම මගේ සිංහල පවුලෙනුත් සිදුවුණා. මගේ ඇස් අන්ධ වූ පසු මගේ මව්පියන් මාව පාරට ඇද දැමුවා. වසර 11ක් මම තනිවම අප්‍රමාණ දුක් වින්දා. නමුත් මම වගකීමෙන් කියනවා, මා කවුද කියා සොයන්නේ නැතිව මට උදව් කළ අයගෙන් බහුතරයක් ද්‍රවිඩ සහ මුස්ලිම් ජනතාවයි. ද්‍රවිඩ වූ පළියට හෝ මුස්ලිම් වූ පළියට ඔවුන් ත්‍රස්තවාදීන් නොවෙයි. කරුණා කරලා ඒ අහිංසක මිනිසුන්ව ඔබලාගේ මේ කුඩුකේඩු, ලේවැකි දේශපාලන සෙල්ලමට (Bloody game) පාවිච්චි කරන්න එපා.

ඊළඟට මට කතා කරන්නම ඕනෑ කාරණාවක් තිබෙනවා. ඒ මල්වානේ සිදුවූ අලුත් ශිෂ්‍ය ව්‍යාපාරයේ නාටකයයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් පිරිසක් මල්වානේ ඉඩමක් අත්පත් කරගෙන තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කය තුළ පමණක් ආබාධිත පුද්ගලයන් 15,000ක් සිටින අතර මුළු රටේම ලක්ෂයකට අධික ආබාධිත පිරිසක් ඉන්නවා. සමාජ සුභසාධන අමාත්‍යාංශය හරහා ඔවුන් වෙනුවෙන් මධ්‍යස්ථානයක්

ඉදිකිරීමට කටයුතු යොදා තිබියදී, සිසුන් ලවා එය අත්පත් කරගෙන තිබෙනවා. මේවා දේශපාලන න්‍යාය පත්‍ර (Collaborated Bushrat). මට කොටින්ගේ න්‍යායාචායර් ඇන්ටන් බාලසිංහම් සහ ඇඩෙල් බාලසිංහම්ව මතක් වෙනවා. ඔවුන් එදා කුඩා දරුවන්ගේ අතේ සයනයිඩ් කරල් පැලඳුවා. ඔවුන් න්‍යායාචායර්වරුන් වුණේ ලෝක සාමය වෙනුවෙන් නොවෙයි, මිනිසුන් සමූල ඝාතනය කිරීම (Genocide) වෙනුවෙනි. අද පැලවත්තේ සිටින ඇතැම් නායකයන් දකින්න ලැබෙනකොට මට මතක් වෙන්නේ ඔවුන්වයි.

මල්වානේ සිටින ඒ අහිංසක විශ්වවිද්‍යාල දරුවන් ගැන මට කනගාටුයි. ඔවුන් මගේ දරුවන් වගේ. අම්මලා තාත්තලා දරුවෙක් විශ්වවිද්‍යාලයට යවන්නේ මහත් බලාපොරොත්තු ඇතිවයි. හැමෝටම කැම්පස් යන්න බැහැ. එහෙව් බුද්ධිමත් දරුවන්ව තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් ගොනාට, බූරුවාට අන්දවා පාවිච්චි කරන මේ නිවට දේශපාලනඥයන්ට හෙන ගහන්න ඕනෑ. මේ වගේ බුද්ධිමත් මොළ කීයක් ඔබලා යුද්ධයේදී විනාශ කළාද? තමන් සැඟවී සිටිමින් මේ ළමයින්ව ඉස්සරහට දමා ජීවිත විනාශ කරනවා. යටඇඳුම්වල හිල් ගැන කියමින්, තට්ටු තුනේ මන්දිර හදන, සූර්ය බලශක්ති පද්ධති (Solar Systems) හදන මේ අයට මම කියන්නේ, අපි තණකොළ කපන්න යනකොට කැත්තෙන් තට්ටුවක් දාලා 'මචං ස්වීට් හාට් කපන්නයි යන්නේ, වෙරි සොරි' කියන්නේ නැහැ; කෙළින්ම කපලා දානවා. අන්න ඒ වගේ දවසක ජනතාව ඔබලාව දේශපාලනයෙන් සම්පූර්ණයෙන්ම කපා දමනවා සිකුරුයි.

ගරු ජනාධිපතිතුමනි, ඔබ මෙවැනි නිවටයෙක් කියා මම හීනෙකින්වත් හිතුවේ නැහැ. අද මාධ්‍ය ඉදිරියට පැමිණ මිනිසුන් කිසිදු බියක් නැතිව බොරු කියනවා. මිලියන 250ක වංචා, සෞඛ්‍ය දෙපාතර්මේන්තුවේ වංචා, ශ්‍රීලංකන් ගුවන් සේවයේ වංචා ගැන කියනකොට, පාලකයන් කියනවා 'අත්වැරදීම් සිදුවෙනවා' කියා. වගකීමක් ඇති බලධාරීන් කියන කතාද මේවා? මම කියන්නේ හැම රාජ්‍ය නිලධාරියෙක්ම තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් රහසිගත පටිගත කිරීම් (Recordings) හෝ කැමරා භාවිත කරන්න කියායි. මොකද, අද තමන් විසින්ම ජීවිත නැති කරගන්නා හෝ අත්වැරදීම් සිදුවන රැල්ලක් (Trend) තිබෙනවා. මෙවැනි අත්වැරදීම් කොතැනකින් හෝ නතර විය යුතුයි. තව වසර හතරක් තිබෙනවා, ජනතාවට දැන් සත්‍යය තේරෙන්න පටන් අරන්. මිනිසුන් පවසන දේ මට ඇහෙනවා. ඔබලා සිටින්නේ ඉහළ තලයක නිසා ඔබට නොඇසෙනවා විය හැකියි, නමුත් ඉදිරියේදී ඇසෙනු ඇත.

මේ රටේ දහස් ගණනක් මව්වරු තවමත් තමන්ගේ මියගිය හෝ අතුරුදන් වූ පුතුන් එනතුරු බලා සිටිනවා. යුද කඳවුරුවල දරුණු ලෙස ආබාධිත වූ සොල්දාදුවන් එක්තැන් වී සිටිනවා. මගේ පවුලේ අයවත් මා වෙනුවෙන් ජීවිතය කැප කළේ නැහැ. නමුත් ඒ අහිංසක තරුණ රණවිරුවන් තමන්ගේ ජීවිත කැප කළේ රට බේරගන්නයි; ඔබලා වැනි හිවලුන්ට නාට්‍ය රඟපාන්න නොවෙයි.

ජීවන්ත පීරිස් පියතුමනි, මේ රටේ සිටින හිවල් දේශපාලනඥයිනි, නිවට බලධාරයිනි, මම ඔබට අභියෝග කරනවා (I challenge you!). මගේ ජීවිතය විනිවිද පෙනෙන සුළුයි, මට හැංගෙන්න තැනක් නැහැ. ඔබලාට හැමදාම මිනිසුන්ව මුළා කරන්න බැහැ. ප්‍රධාන ප්‍රශ්න මතු වන විට, ජනතා අවධානය වෙනතකට යොමු කිරීමට 'මල්වාන නාටකය' වැනි දේ කරළියට දමන බව අපිට තේරෙනවා; අපි බබාලා නොවෙයි. විශ්වවිද්‍යාල දරුවනේ, කරුණා කරලා කාගෙවත් අතකොළුවක් නොවී, අධ්‍යාපනය අවසන් කර රටට සේවයක් කරන්න. මව්පියන් ඔබෙන් බලාපොරොත්තු වන්නේ එයයි; දේශපාලන පක්ෂවල රූකඩ වීම නොවෙයි.

ලබන වසරේ මුල්ලිවෙක්කාල්හි කොටි ත්‍රස්තයන් සැමරීමට ඉඩ නොදෙන බව මම වගකීමෙන් කියනවා. කාන්තාවක වැනි මට ඇති කොන්ද පණ ඇති ගතිගුණවත් ඔබලාට නැති වීම ගැන මම ලැජ්ජ වෙනවා. ඊළඟ පාරත් මෙවැනි වරදක් කරන්න හැදුවොත් අපි ශ්‍රී ලාංකිකයන් විදිහට ඊට නිසි උත්තර දෙනවා. ශ්‍රී ලංකාව අයිති ශ්‍රී ලාංකිකයන්ටයි. එය සිංහල, දෙමළ, මුස්ලිම් හෝ වේවා ඕනෑම භාෂාවක් කතා කරන සැමට පොදුයි. ඔබ සැමගේ අවධානයට බොහොමත්ම ස්තුතියි!"